*සැ. යු.* - 2025.09.26 වැනි දින පළ කරන ලද අංක 2456 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,457 - 2025 ඔක්තෝබර් මස 03 වැනි සිකුරාදා - 2025.10.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | 1148 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1154 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12. 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

### ක්‍රීඩා නිලධාරී (කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 02 සේවා ගණයේ III ශ්‍රේණිය) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

දකුණු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව : 17

01. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්, දකුණු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් අයදුම්කරුවන් දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එම යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. එම එක් එක් පරීක්ෂණයේ දී ලකුණු ලබාගත යුතු ආකාරය මෙම නිවේදනයේ අංක 08 යටතේ දක්වා ඇත.

02. අවශ්‍ය සුදුසුකම් :

(අ) *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

I. සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්ව තිබීම ;

*සහ*

II. අ.පො.ස.උසස් පෙළ විභාගයේ නව නිර්දේශය අනුව සියලුම විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර); හෝ පැරණි නිර්දේශයේ විෂයයන් තුනක් (03) සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම ;

*සහ*

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරගයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම ;

*හෝ*

ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම ;

*හෝ*

ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගවල 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම ;

*හෝ*

(ආ) I. සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම ;

*සහ*

II. දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදුරාජ්‍ය මණ්ඩලීය තරග, ඔලිම්පික් තරග හෝ ලෝක ශූරතා තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර 1, 2 හෝ 3 ස්ථාන සඳහා පදක්කම් ලබා තිබීම.

* ඉහත සඳහන් සුදුසුකම් යටතේ බඳවා ගන්නා නිලධාරින් වසර තුනක් (03) ඇතුළත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා ගැනීම සේවාව ස්ථිර කිරීම සඳහා අනිවාර්ය වේ. මෙම ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් පළමු වසර තුනක් (03) තුළ ලබා නොගන්නා නිලධාරින්ගේ සේවය පරිවාස කාලය අවසානයේ දී ස්ථිර නොකරන අතර, ඔවුන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ. එලෙස වැටුප් වර්ධක විලම්භනය කිරීමට භාජනය වූ නිලධාරියෙකු එසේ වැටුප් වර්ධක විලම්භනය කරන දින සිට වසර දෙක (02) කාලයක් තුළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා ගැනීමට අසමත් වන්නේ නම් ඔහුගේ පත්වීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත අකාර්යක්ෂමතාවය මත දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අවසන් කළ යුතු ය.

03. *පළපුරුද්ද :*

අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

04. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

05. වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර අවම වශයෙන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ආසන්න වසර තුනක (03) අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඇති අයෙකු බව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් මගින් තහවුරු කළ යුතු ය.

IV. අයදුම්පත් කැඳවීමේ දිනට අංක 02 සිට අංක 06 දක්වා වූ සියලුම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. *වයස් සීමාව :*

අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 35

07. *වැටුප් පරිමාණය :*

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය -

**රු. 50,630 – 10 x 630 - 11 x 670 – 10 x 1010– 10 x 1190 – රු. 86,300 (MT 02 – 10-2025) වේ.**

එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිටවන අතර, පත්වීම ක්‍රියාත්මකවන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

I. *වෘත්තීය පරීක්ෂණය :*

ශාරීරික යෝග්‍යතාවය පිරික්සීම සඳහා දකුණු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ පහත අංගයන්ගෙන් හා පරීක්ෂණ අටකින් (08) සමන්විතය. (ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෙඅත්වල ශක්තිය, උලඟිතාවය, හිටිදුර පැනීම, වේගය හා දරා ගැනීම.) එම එක් එක් පරීක්ෂණය සඳහා ලකුණු 30ක අවමයක් ලබා තිබීම අනිවාර්යවන අතර විෂයයන් සියල්ලෙහි සාමාන්‍ය 40%ක් හෝ ඊට වැඩි ගණනක් විය යුතුය.

II. *යෝග්‍යතාවය ඇගයීමේ පරීක්ෂණය :*

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ. |
| 02 | ක්‍රීඩා දක්ෂතාවයන් | 70 | |
| 03 | ක්‍රීඩා පුහුණු කිරීම්, තරග විනිශ්චය / තරග සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | 15 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

09. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

වෘත්තීය පරීක්ෂණයට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් කට්ටලයක් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(*අ*) සෑම අයදුම්කරුවෙකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී නැවත නොගෙවන රු.1000.00ක මුදලක් වෘත්තීය පරීක්ෂණ ගාස්තු ලෙස ගෙවිය යුතු ය. එම ගාස්තුව “ලේකම්, දකුණු පළාත් ක්‍රීඩා, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය” යන නමින් **ගාල්ල, කොටුව ලංකා බැංකුවේ** පවත්වාගෙන යනු ලබන **1587434** යන ගිණුම් අංකයට බැර කර අදාළ ලදුපත අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතු ය. මුදල් ගෙවීම ලංකාව තුළ ඕනෑම ලංකා බැංකු ශාඛාවක් තුළින් කළ හැකිය.

(*ආ*) අයදුම්පත් **2025.11.03** දිනට හෝ එදිනට ප්‍රථම “දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, 3 වන මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල” යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*ඇ*) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත්, දෙවන පිටුව අංක 07 සිට 09 දක්වාත් තෙවන පිටුව 10 සිට 13 දක්වාත් සිව්වන පිටුව 14 සිට 15 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(*ඈ*) අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ “දකුණු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම ” යනුවෙන් සඳහන් කළ යුතු ය.

(*ඉ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙක්, හෝ රු. 82,150/- ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(*ඊ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

( උ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අමාත්‍යාංශයට ලැබීමට පෙර අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම:*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. **පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය සතු වේ.**

කේ. යූ. චන්ද්‍රලාල්,<br>ලේකම්.<br>දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*දකුණු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම*

[ ]
( කාර්යාලීය ප්‍රයෝජනය සඳහා )

1. මුලකුරු සමග නම ( මයා / මිය / මෙනෙවිය )

සිංහලෙන් :- ..............................................................................................................................................
..............................................................................................................................................

ඉංග්‍රීසියෙන් :-..............................................................................................................................................
..............................................................................................................................................

1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම ( පැහැදිලි අකුරෙන් ) :-

සිංහලෙන් :-..............................................................................................................................................
..............................................................................................................................................

ඉංග්‍රීසියෙන් :-..............................................................................................................................................
..............................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ............................................................

3. උපන් දිනය :-

වර්ෂය : ............................. මාසය: ......................... දිනය: ..........................

3.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-

අවුරුදු: ............................. මාස: ........................... දින: .......................

4. ස්ත්‍රී / පුරුෂ භාවය ( පුරුෂ - M, ස්ත්‍රී – F ) :- [ ]

5. විවාහක / අවිවාහක බව :-....................................

6. ස්ථිර ලිපිනය ( පැහැදිලි අකුරෙන් ) :-..............................................................................................................................................
..............................................................................................................................................

7. දුරකතන අංකය : ස්ථාවර : .........................................................
ජංගම : ...........................................................

8. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාග වර්ෂය හා මාසය : ......................................
II. විභාග අංකය : ......................................................
III. සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

8.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාග වර්ෂය හා මාසය : ......................................
II. විභාග අංකය : ......................................................
III. සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

9. ක්‍රීඩා ජයග්‍රහණ :

| වර්ෂය | ක්‍රීඩා උළෙල | අදාළ මට්ටම | | ක්‍රීඩාව | ජයග්‍රහණය ලබාගත් ස්ථානය |
|---|---|---|---|---|---|
| | | පළාත් | ජාතික | | |
| | | | | | |
| | | | | | |

10. වෘත්තීය සුදුසුකම් :-.........................................................................................................................................
.........................................................................................................................................
.........................................................................................................................................

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව් / නැත.
ඔව් නම් විස්තර සඳහන් කරන්න. .........................................................................................................
.........................................................................................................................................
.........................................................................................................................................
..........................................................................................................

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ......................................................
ලදුපත් අංකය හා දිනය : .........................................................
ගෙවූ මුදල : ....................................................................................

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

13. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව දැන සිටිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.................................                                    ......................................,
දිනය                                    අයදුම්කරුගේ අත්සන.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................ නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු / ඇය ........................................ දින මා ඉදිරිපිට දී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

..........................................,
සහතික කරන්නාගේ අත්සන.

දිනය:- .....................................................................................
සහතික කරන්නාගේ නම:- .......................................................
තනතුර :- ..................................................................................
ලිපිනය :- .................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න. )

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ( රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි. )

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ, වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය / අසතුටුදායකය.

සියළු වැටුප් වර්ධක උපයා ඇත / නැත.
කිසිඳු විනය දඬුවමකට ලක්වී නැත / ඇත.

15.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය.

ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරමි / නොකරමි.

........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :...........................

10-63

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - ඌව පළාත් සභාව**

ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) පුහුණු පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටම (NVQ 4) - 2025 - II

01. ඉහත පුහුණු පාඨමාලාව සඳහා සුදුසුකම්ලත් සිසුන් බඳවා ගැනීම සඳහා, ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුහුණු පාඨමාලාව ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින බිබිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබේ.

02. මෙම පුහුණු පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලබන එක් වසරක පූර්ණ කාලීන පුහුණු පාඨමාලාවක්වන අතර මාස 06ක න්‍යායාත්මක පුහුණුවක් සහ මාස 06ක ඌව පළාත තුළ කර්මාන්තගත ප්‍රායෝගික පුහුණුවකින් සමන්විත වේ. මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන පුහුණුලාභීන්ට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහතිකයක් හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන NVQ Level 4 සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

03. කෘෂිකර්මාන්තය ව්‍යාපාරයක් වශයෙන් කිරීමට හෝ ස්වයං රැකියාවක නියැලීමට අදහස් කරන අය සඳහා මෙම පුහුණු පාඨමාලාව ඉලක්ක කර ඇත. ජාතික වෘත්තීය නිපුණතා 5 මට්ටමේ අදාළ පාඨමාලාවක සිට ඉදිරියට ඉගෙනීම සඳහා මෙම ජාතික වෘත්තීය නිපුණතා මට්ටමට 4 මූලික සුදුසුකමක් වනු ඇත.

04. ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) පුහුණු පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) පාඨමාලාවේ විෂයය නිර්දේශය පහත පරිදි වේ :

- m - 01 කෘෂිකර්මයේ මූලික සිද්ධාන්ත (Fundamentals of Agriculture)
- m - 02 වී හා අනෙකුත් ධාන්‍ය වර්ග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම (Establishment and Maintenance of Paddy and Other Cereals)
- m - 03 වෙනත් ක්ෂේත්‍ර බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම (Establishment and Maintenance of Other field Crops - OFC)
- m - 04 උද්‍යාන බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම (Establishment and Maintenance of Horticultural Crops)
- m - 05 අස්වනු නෙලීම හා ප්‍රාථමික සැකසුම් (Harvesting and Primary Processing)
- m - 06 ගොවිපළ යන්ත්‍රෝපකරණ, උපකරණ හා මෙවලම් නඩත්තුව (Maintenance of Farm Machineries, Equipment and Tools)
- m - 07 කෘෂි ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (Implementation of Agricultural Extension Programme)
- m - 08 ආයතනික සන්නිවේදන කුසලතා (Communication Skills for Workplace)
- m - 09 භාෂා සාක්ෂරතාවය හා සංඛ්‍යාත්මක දැනුම (Language Literacy and Numeracy)
- m -10 කණ්ඩායම් ක්‍රියාකාරකම් (Team work)
- m - 11 වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රියාපටිපාටි හා භාවිතයන් (Occupational Health and Safety Procedures and Practice)

05. 2025 වසරේ දෙවන කණ්ඩායම **2025 ඔක්තෝබර් මස** අවසන් සතිය තුළ බඳවා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම පාඨමාලාවට අයදුම් කරන, අයදුම්කරුවන් අඟල් 8x12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේම මුද්‍රණය කරන ලද අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව සකස් කළ අයදුම්පත්‍ර **2025 ඔක්තෝබර් මස 15 දිනට පෙර** පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමුකළ යුතුය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **NVQ 4 මට්ටමේ පාඨමාලාව සඳහා අයදුම්පත් - 2025 - II**" ලෙස සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ හෝ අපිළිවෙළට එවා ඇති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*අයදුම්පත් එවිය යුතු ලිපිනය.-* ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, රත්වත්ත මාවත, බදුල්ල.

06. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව තරග විභාගයක් පැවැත්වීම හෝ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් පුහුණු පාඨමාලාවට බඳවා ගැනීම ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබේ.

සුදුසුකම් ලබන අයදුම්කරුවන් අතුරින් පාඨමාලාව සඳහා බඳවා ගත යුතු ප්‍රමාණය මෙන් දෙගුණයක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම සුදුසුකම් ලබන අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

අදාළ තරග විභාගය/සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයන් ලිඛිතව/Email මගින් අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලබන අතර, ඌව පළාත් සභා වෙබ් අඩවියට පිවිසීමෙන් මේ පිළිබඳව දැනුවත් විය හැක.

07. මෙම පාඨමාලාව සම්බන්ධ වැඩිදුර විස්තර 055 2265423 දුරකථන අංකය ඔස්සේ බිබිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ ගොවිපළ කළමනාකරු වෙතින් ලබාගත හැක.

08. *පාඨමාලාවට අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :*

8.1 අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම ;

අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා කෘෂිකර්ම විෂය හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

8.2 වෙනත් සුදුසුකම් :

i. සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18 - 40 ත් අතර විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඌව පළාතේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීමෙන් අනතුරුව, පුරප්පාඩු පැවතියහොත් පමණක් පිට පළාත්වල අයදුම්කරුවන් බඳවා ගැනීම පිළිබඳව ද සලකා බලනු ඇත. ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

09. *පුහුණු පාඨමාලාව සඳහා දිරි දීමනාව :*

i. බිබිල දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව පැවැත්වෙන මුල් මාස 6 දී පුහුණුව පැවැත්වෙන සෑම දිනක් සඳහාම ඊට සහභාගිවන එක් එක් අභ්‍යාසලාභියාට, රුපියල් පන්සියය (රු. 500.00) බැගින් දීමනාවක් ගෙවනු ලැබේ. කර්මාන්තගත පුහුණු මාස 6 සඳහා ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් දීමනාවක් ගෙවනු නොලැබේ.

10. *වෙනත් කරුණු :*

i. මෙම පාඨමාලාව සඳහා 25 දෙනෙකු බඳවා ගැනේ.

ii. පුහුණුව අවසානයේ ආපසු ගෙවනු ලබන රු. 1,000.00 ක ඇප තැන්පතුවක් අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සඳහා ලියාපදිංචි වන දිනයේ දී දෙපාර්තමේන්තුවේ ගිණුමට තැන්පත් කළ යුතුය. පාඨමාලාව සම්පූර්ණ නොකරන්නේ නම් එම මුදල නැවත ගෙවනු නොලැබේ.

iii. පුහුණු කාලය තුළ ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නේවාසික පහසුකම් හෝ ආහාර පාන ලබා දීම සිදු නොකෙරේ.

iv. පුහුණුව අවසන් කළ පසු රැකියා ලබා දීමට ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බැඳී නොමැත.

v. කිසියම් විනය විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වීම හෝ අනුබල දීමට වැරදිකරු වේ නම්, ශිෂ්‍යභාවය අවලංගු කිරීමට බලධාරීන් පියවර ගනු ලැබේ.

11. *සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු සහතික :*

i. පදිංචිය සනාථ කිරීමට ග්‍රාම නිලධාරි සහතිකය,

ii. චරිත සහතික 2ක් ඉදිරිපත් කළ යුතු අතර, එක් සහතිකයක් රාජ්‍ය සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරියෙකුගෙන් ලබා ගත යුතුය,

iii. සම්මුඛ පරීක්ෂණයේ දී ජාතික හැඳුනුම්පත සමඟ අධ්‍යාපන හා වෙනත් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි වන අවස්ථාවේ මෙම සහතිකවල ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතුය.

12. අයදුම්කරුවන් ප්‍රායෝගික කෘෂිකර්මාන්තයට සුදුසු ශාරීරික හා මානසික තත්වයක සිටින බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් මගින් පාඨමාලාව සඳහා ලියාපදිංචිවන දිනයේ සනාථ කළ යුතුය.

## ආදර්ශ අයදුම්පත්‍රය

### ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) පාඨමාලාව (NVQ 4) ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

01. (i) සම්පූර්ණ නම :.......................................................................................................................................
(සිංහලෙන්)

(ii) සම්පූර්ණ නම :.......................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iii) මුලකුරු සමග නම :.......................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. ස්ත්‍රී/පුරුෂ භාවය : ..............................................

03. (i) ස්ථිර ලිපිනය :.......................................................................................................................................
(සිංහලෙන්)

(ii) ස්ථිර ලිපිනය :.......................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iii) දුරකථන අංක : නිවස :........................................ ජංගම :........................................

(iv) විද්‍යුත් තැපැල් ලිපිනය :.......................................................................................................................................
(සක්‍රිය ලිපිනයක් විය යුතුයි)

(v) WhatsApp අංකය :.......................................................................

04. (i) උපන්දිනය :..............................................

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :................... මාස : ..................... දින :.........................

05. ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................

06. පදිංචිය පිළිබඳ විස්තර :

(i) පදිංචි දිස්ත්‍රික්කය :..............................................................
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..............................................................
(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..............................................................
(iv) ඌව පළාතේ පදිංචි කාලය :..............................................................

07. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

වර්ෂය :.................. විභාග අංකය :.............................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

වර්ෂය :.................. විභාග අංකය :.............................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගය :

වර්ෂය :.................. විභාග අංකය :............................. වර්ෂය :.................. විභාග අංකය :.............................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(iii) වෙනත් සුදුසුකම් :..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

08. හදිසි අවශ්‍යතාවයක දී දැනුම් දිය යුතු පුද්ගලයෙකුගේ විස්තර :

(i) නම :....................................................
(ii) අයදුම්කරුට ඇති සම්බන්ධතාවය :....................................................
(iii) ලිපිනය :....................................................
(iv) දුරකථන අංකය : ජංගම :……….........…………… නිවස :………………........……….

ඉහත දැක්වූ තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. වැරදි හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළ බව මා තෝරා ගැනීමෙන් පසු හෙලිවුවහොත් මාගේ ශිෂ්‍යභාවය අහෝසිවන බවත්, ඒ සම්බන්ධයෙන් නියම කරන ලද දඩ මුදලක් ගෙවීමට මා එකඟ වන බව මම තේරුම් ගත්තෙමි.

....................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................

10 - 69

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | සිකුරාදා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2025.12.05 | සිකුරාදා | 2025.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.12 | සිකුරාදා | 2025.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.19 | සිකුරාදා | 2025.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.26 | සිකුරාදා | 2025.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2025 ජූනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.